# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# රත්මලාන

**01**. **තාක්ෂණික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය**
**වැටුප් පරිමාණය:** U-MT I (III) – Rs. 31,625 – 07x300 - 10x355 – 37,275 p.m

**බාහිර අයදුම්කරුවන්**

(i) එක් වරකදී අ.පො.ස (උ.පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් විෂයන් තුනකින් (03) සමත් වී තිබීම.

සහ

(ii) (අ) පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ වෙනත් ආයතනයකින් නිකුත් කරන ලද ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික විද්‍යාව / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ NVQ-05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ආ) ශ්‍රව්‍ය දෘශ්‍ය පිළිබඳ වසරක පළපුරුද්ද සහිත (ii) (අ) හි ඉහත සුදුසුකම්වලට සමාන ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික විද්‍යාව / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබා තබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(i) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සියලු සුදුසුකම් සපුරා තිබීම.

**වයස** : අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

**තෝරාගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- විෂය දැනුම

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

**පොදු කොන්දේසි**

01. යහපත් චරිතයකින් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

02. තෝරා ගන්නා අයදුම්කරුවන්, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයකු වනු ඇත. ඔහු / ඇය, සිය මාසික වැටුපෙන් 10%ක මුදලක් අරමුදලට දායකත්වය දරන අතර ඊට සමගාමීව විශ්ව විද්‍යාලය එම වැටුපෙන් 15%ක මුදලක් දායක කරනු ඇත. 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ ප්‍රතිපාදනවලට අනුව විශ්ව විද්‍යාල වැටුපෙන් 3%ක මුදලක්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක කරනු ඇත.

03. පත්වීමේ සෙසු කොන්දේසි, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල පනතේ ප්‍රතිපාදන වලට අනුකූල වේ.

04. විශ්ව විද්‍යාල / ආයතන / රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල වල අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මගින් එවිය යුතුය.

05. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්ව විද්‍යාලය සතු වෙයි.

06. උප්පැන්න සහතිකය, අ.පො.ස.(සා.පෙළ), අ.පො.ස.(උ.පෙළ) සහතික වල හා පළපුරුද්දට අදාළ වෙනත් සහතික වල පිටපත් අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

07. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල වෙබ් අඩවියක් බාගත කරගත හැකි ආකෘතියට අනුව පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. එම අකෘතියට අදාළ නොවන, පමාවී ලැබෙන හෝ අසම්පූර්ණ හෝ ඉහත අංක 04 කොන්දේසියට අනුකූල නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රත්මලාන** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

09. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2023.10.31